# 2. සූත්‍ර පාඨයන්ගේ අර්ථ විවරණය




•

**පසුගිය ලිපියෙන් අපි මධුපිණ්ඩික සූත්‍රයෙහි මූලික අර්ථ විවරණ ඉදිරිපත් කළෙමු. මෙවර ලිපියෙන් සූත්‍ර පාඨයන්ගේ ගැඹුරු අර්ථ විවරණය, එම තැන්හි පරමාර්ථ වශයෙන් උපදින සිත් සහ එම සිත් චිත්ත වීථි තුළ යෙදෙන අයුරු විස්තර කරන්නෙමු.**

**<u>ලක්ඛණ, රස, පච්චුපට්ඨාන, පදට්ඨාන</u>**

**<u>“චක්ඛුඤ්චාවුසො, පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං” ඇවැත්නි, ඇස ද රූපයන් ද නිසා චක්ෂුර්විඥානය උපදී.</u>**

මෙහි ඇස නම් චක්ඛු ප්‍රසාද රූපයයි.චක්ඛු ප්‍රසාද රූපය කර්මජය. (කර්මය නිසා උපදින්නකි) චක්ඛු ප්‍රසාද රූපය චක්ඛු විඤ්ඤාණය ඉපදීමට නිශ්‍රය භාවයෙන් ප්‍රත්‍යය වේ. එනම් චක්ඛු විඤ්ඤාණය ඉපදීමට පිහිටවීමට උපකාර වීමයි. රූපය නම් කර්ම, චිත්ත, ඍතු, ආහාර යන සතර ප්‍රත්‍යයන් නිසා උපන් රූපයෝය. පරමාර්ථ ධර්මය වර්ණ රූපයයි. එම වර්ණ රූපයද චක්ඛු ප්‍රසාදය ද නිසා චක්ඛු විඤ්ඤාණය පහළ වේ. චක්ඛු විඤ්ඤාණයෙහි කෘත්‍යය නම් රූපය දැකීමයි. පරමාර්ථ වශයෙන් අකුසල විපාක සහ කුසල විපාක චක්ඛු විඤ්ඤාණ යුගලයයි.

**<u>“තිණ්ණං සඞ්ගති ඵස්සො” – මේ තුන් දෙනාගේ එක්වීමෙන් ස්පර්ශය වෙයි</u>**

ඉහත දැක්වෙන ‘‘තිණ්ණං සඞ්ගති ඵස්සො’’ යන පාඨය සූක්ෂමව විමසා බැලිය යුත්තකි. සූත්‍ර අටුවාවෙහි මෙය විස්තර කරනුයේ ඇස ද, රූපය ද, චක්ඛු විඤ්ඤාණය යන මෙම තුනෙහි සමෝධානයෙන් (රැස්වීමෙන්, එකතුවීමෙන්) ඵස්සය උපදින බවයි. ඵස්සය අරූපී ධර්මතාවකි. චක්ෂුව සහ රූපය රූපී ධර්මතාවන්ය. ‘‘සඞ්ගති ’’ (රැස්වීම, එකතුවීම) යන පාලි පදයෙහි වචනාර්ථයෙන් මේ පිළිබඳ විමසුවහොත් රූපී ධර්මතාවන් සහ අරූපී ධර්මතාවන් එකතුවන්නේ කෙසේදැයි පැනයක් ඇතිවේ. ඉහත ගැටළුවට පිළිතුර සහ ප්‍රායෝගිකව හඳුනාගැන්මට අපහසු ඵස්සය තේරුම් ගැනීමට උපකාරයක් අත්ථසාලිනී නම් ධම්මසංගණී අටුවාවේ පැමිණේ.

පරමාර්ථ ධර්මයක් ලෙස ‘‘තිණ්ණං සඞ්ගති ඵස්සො’’ යන තැන ‘ඵස්සො’ යනු ඵස්ස චෛතසිකයයි. සිත එකකි. රූප,ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ සහ ධම්ම යන ආරම්මණයෝ අනෙකකි. සිතෙහි කෘත්‍යය අරමුණ දැනගැනීමයි. අරමුණු දැනගැන්මට නම් සිත අරමුණෙහි පැහැසිය යුතු වේ. එම කාර්යය සිදු කරන අරමුණෙහි ස්පර්ෂ වන ආකාරයකින් සිතෙහි උපදනා චෛතසිකය ඵස්සය වේ. විදර්ශනාවේදී පරමාර්ථ ධර්මයක් වටහා ගැනීම පහසුවනු පිණිස ඒ එක් එක් ධර්මය ආකාර සතරකින් පැහැදිලි කරයි.

1. ලක්ඛණ – ලක්ෂණයයි.

2. රස – මෙය කෘත්‍යය සහ සම්පත්ති යන දෙයාකාරයට විස්තර වේ.
   කෘත්‍යය අර්ථයෙන් – ඒ පරමාර්ථ ධර්මය සිදුකරන කාර්යයි.
   සම්පත්ති අර්ථයෙන් – ඒ පරමාර්ථ ධර්මය නිසා වන ඵලයයි.

3. පච්චුපට්ඨාන – එම පරමාර්ථ ධර්මය වැටහෙන ආකාරය

4. පදට්ඨාන – එම පරමාර්ථ ධර්මය ඉපදීමට ආසන්න හේතුවයි.

**ඵස්සයෙහි ලක්ෂණාදී සතර**

1. ලක්ඛණ – ස්පර්ශ වීම ලක්ෂණයයි (ඵුසනලක්ඛණො) . ඵස්සය අරූප ධර්මයක් වන නමුදු ආරම්මණයන්හි පහසන ආකාරයෙන්ම පවතින නිසා ස්පර්ශවීම ලක්ෂණ කොට ඇත්තේය.

2. රස – සඞ්ඝට්ටන රසයයි (සඞ්ඝට්ටනරසො).
   <u>කෘත්‍යය අර්ථයෙන්</u> – ඒකදේශයකින් දර කැබලි දෙකක් එකිනෙකට ඇලෙන්නාක් මෙන් නොඇලෙන්නේ නමුදු රූපය චක්ෂුවෙහි ද, සද්දය ශ්‍රෝතයෙහි ද ගැටෙන්නාක් මෙන් සිත සහ ආරම්මණය ගැටෙන නිසා සංඝට්ටන රසයයි.

<u>සම්පත්ති අර්ථයෙන්</u> – චක්ඛු සෝතාදී වස්තූන් රූපාදී ආරම්මණය හා ගැටීම නිසා ඵස්සය උපදනා බැවින් සම්පත්ති අර්ථයෙන් ද සංඝට්ටන රසය වේ.

3. පච්චුපට්ඨාන – ඵස්සය දෙයාකාරයකට වැටහේ. ( සන්නිපාතපච්චුපට්ඨානො , වෙදනාපච්චුපට්ඨානො )
<u>සන්නිපාතපච්චුපට්ඨානො</u> – රැස්වෙන ආකාරයෙන් වැටහේ. "තිණ්ණං සඞ්ගති ඵස්සො" යන ත්‍රික සන්නිපාත සංඛ්‍යාත වූ (චක්ඛු ආදී වස්තු සය, රූපාදී ආරම්මණ සය, චක්ඛු විඤ්ඤාණාදී විඤ්ඤාණ සය) ඵස්සයාගේ හේතූන් වශයෙන් වැටහේ.
<u>වෙදනාපච්චුපට්ඨානො</u> – වේදනාව උපදවන ආකාරය වැටහීම කොට ඇත්තේය. (ස්පර්ශය හේතුවෙන් වේදනාව උපදින බැවිනි.)

4. පදට්ඨානය – ආරම්මණය ආපාථගතවීම ආසන්න හේතුවයි. ඒ ඵස්සයට හේතුභූත වූ එක්තැන් කිරීමක් ද ඉන්ද්‍රියන්ගෙන් වූ (ආපාථගතවිසයපදට්ඨානො) පරමාර්ථ ධර්මය ඉපදීමට ආසන්න හේතුවයි.

එවං පවෙදිතත්තා පන තෙනෙවාකාරෙන පච්චුපට්ඨාතීති සන්නිපාතපච්චුපට්ඨානොති වුත්තො. ඵලට්ඨෙන පන පච්චුපට්ඨානෙනෙස වෙදනාපච්චුපට්ඨානො නාම හොති. වෙදනඤ්හෙස පච්චුපට්ඨාපෙති උප්පාදෙතීති අත්ථො.

මෙසේ මනාව දැන ගන්නා බැවින් ඒ අයුරින්ම එළඹ සිටිනුයි "සන්නිපාතපච්චුපට්ඨානො" යැයි කියන ලදී. ඵල අර්ථයෙන් වනාහි පච්චුපට්ඨානයෙන් එය වෙදනා පච්චුට්ඨානය නම් වේ. තෙල ස්පර්ශය වේදනාව එළඹවයිද උපදවයි ද යන අර්ථයයි.

**<u>"ඵස්ස පච්චයා වේදනා – ස්පර්ශය නිසා වෙදනාව වෙයි."</u>**
සුඛ, දුක්ඛ, උපේක්ෂා වශයෙන් ඒ ඒ අරමුණට අනන්‍ය වූ රසයන් ඇත. වේදනාවේ කෘත්‍යය එම රස අනුභවනය කිරීමයි. ඵස්සය වේදනාවට පමණක් නොව සෙසු අරූපී ධර්මතා රාශියකට ප්‍රත්‍යය වේ. එසේ තිබියදී වේදනා වෙන් කොට දක්වනුයේ වේදනාව ඵස්සයෙහි විශේෂ ඵලය නිසාය.

**<u>"යං වෙදෙති තං සඤ්ජානාති " – යමක් විඳිනු ලබන්නේද එය හඳුනා ගනී.</u>**
සඤ්ජානාති පදයෙන් අදහස් වනුයේ සඤ්ඤා චෛතසිකයයි. සඤ්ඤා චෛතසිකයෙහි ලක්ෂණය නම් අරමුණ සළකුණු කොට දැනගැනීමයි. නිල්, රතු, සුදු, දිග, උස, පළල ආදී වශයෙන් නානා ප්‍රභේද ඇති ෂඩ් ඉන්ද්‍රියන්ට ගෝචර වන අරමුණු නැවත හැඳින ගැනීමට හැකිවන ආකාරයෙන් සලකුණු කිරීම මෙම චෛතසිකයෙන් සිදු වේ. සඤ්ඤා චෛතසිකය සෑම සිතකම පහළ වේ. වේදනාව මගින් යමක් අරමුණු වූයේ ද එම අරමුණ

සඤ්ඤාව මගින් සළකුණු කොට දක්වයි. වේදනාව නොවේ. *(තාය වේදනාය යං ආරම්මණං වෙදෙති, තදෙව සඤ්ඤා සඤ්ජානාති)*

**<u>“යං සඤ්ජානාති තං විතක්කෙති” – යමක් හඳුනා ද එය විතර්කණය කෙරෙයි.</u>**
මෙහි විතක්කෙති යන තැන පරමාර්ථ ධර්මය නම් විතර්ක චෛතසිකයයි. විතර්කයෙහි ලක්ෂණය නම් සිත අරමුණ නැංවීමයි. යම් අරමුණක් පිළිබඳව නිල්,රතු සුදු, දිග ආදී වශයෙන් සළකුණු කිරීමක් සිදු කළේ ද එය නැවත නැවතත් සිතට අරමුණු කෙරේ.

**<u>“යං විතක්කෙති තං පපඤ්චෙති” – යමක් විතර්කණය කෙරේ ද, එය ප්‍රපඤ්චයට පමුණුවයි.</u>**
යම් අරමුණක් විතර්කයට නැංවූයේ ද එය තණ්හා,දිට්ඨි,මාන වශයෙන් ප්‍රපඤ්ච කරයි.

**ඉහත සූත්‍ර පාඨය චක්ඛුද්වාරික චිත්ත වීථියකින්**




•

මෙහි ඵස්ස,වෙදනා, සඤ්ඤා චක්ඛු විඤ්ඤාණ සහජාත (චක්ඛු විඤ්ඤාණය සමග එකට හටගත්) ඒවා වෙත්. විතර්කය චක්ඛු විඤ්ඤාණ සිතට අනතුරුව උපදින සම්පටිච්ඡන සිතෙහි පටන් සවිතර්ක සිත්වල ඇතිවේ.

***(තත්ථ ඵස්සවෙදනාසඤ්ඤා චක්ඛුවිඤ්ඤාණෙන සහජාතා හොන්ති. විතක්කො චක්ඛුවිඤ්ඤාණානන්තරාදීසු සවිතක්කචිත්තෙසු දට්ඨබ්බො. පපඤ්චසඞ්ඛා ජවනෙන සහජාතා හොන්ති.)***

ඉහත චක්ෂුව ද, රූපය ද නිසා උපදින චක්ඛු විඤ්ඤාණයෙහි සම්ප්‍රයෝග වන ඵස්ස චෛතසිකය "තිණ්ණං සඞ්ගති ඵස්සො" යන තැන ඵස්සය වේ. ඵස්සය එම සිතෙහි උපදනා වේදනාවට සහජාත අඤ්ඤමඤ්ඤ ආදී ප්‍රත්‍යවලින් ද, පසුව උපදනා සිතට අනන්තර ප්‍රත්‍යයෙන් ද, ඉන්පසුව උපදනා සිත්වලට උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ද ප්‍රත්‍යය වේ.

***(තං ඵස්සං පටිච්චසහජාතාදිවසෙන ඵස්සපච්චයා වෙදනා උප්පජ්ජති.*** **මජ්ඣිමනිකාය අටුවා, මධුපිණ්ඩිකසුත්තවණ්ණනා; .** ***සහජාතාදිවසෙනාතිචක්ඛුවිඤ්ඤාණසම්පයුත්තාය සහජාතඅඤ්ඤමඤ්ඤාදිවසෙන,අනන්තරාය අනන්තරාදිවසෙන, ඉතරාය උපනිස්සයවසෙන පච්චයභාවතොඵස්සපච්චයාඵස්සකාරණාවෙදනා උප්පජ්ජති.–*** මජ්ඣිමනිකාය ටීකා, මධුපිණ්ඩිකසුත්තවණ්ණනා***)***

ඵස්සයේ පටන් විතර්කය දක්වා ප්‍රවෘත්තිය මෙසේ වේ. අනුරූප ප්‍රත්‍යයන් ඇති කල්හි, චක්ෂුව ද රූපය ද හේතුවෙන් චක්ඛු විඤ්ඤාණය ද, එම විඤ්ඤාණය සමග ඵස්සය වේදනාව සහ සංඥාවද , ඉන්පසු විතර්කය පහළවීම ඒකාන්ත ධර්මතාවකි. ඉහත වීථි සටහනින් දක්වා ඇත්තේ එම චිත්ත නියාමයයි. කුසල-අකුසල රැස්වනුයේ අනතුරුව පහළවන ජවන සිත්වලින්ය. . රහතන්වහන්සේලා හට ද ඉහත චක්ඛුවිඤ්ඤාණයේ පටන් විතර්කය පහළවුවද වොත්ථපන අවස්ථාවෙන් පසුව කුසල-අකුසල පහළ නොවේ. උන්වහන්සේලාට පහළවනුයේ ක්‍රියා සිත්ය.

මෙම සූත්‍රය සසර දිගු කෙරෙන තණ්හා,දිට්ඨි, මාන සහගත ප්‍රපඤ්ච පිළිබඳව වූ පරියාය දේශනාවක් නිසා චිත්ත ප්‍රවෘත්තිය විග්‍රහ කළ හැක්කේ ඒකදේශයකිනි . එනම් ප්‍රපඤ්ච ලෙස ගත හැකි ලෝභ සහගත ජවන් සිත් යොදාගනිමින් පමණකි. එම නිසා සූත්‍රයෙහි නොමුලාවීම පිණිස ජවන සිත්වලට අරමුණු ගන්නා ආකාර පිළිබඳ පහත විග්‍රහය දක්වන්නෙමු.

**<u>ජවන් සිත් වලින් ප්‍රඥප්තිය හා පරමාර්ථ අරමුණු කරන ආකාරය</u>**

නිෂ්පරියාය ලෙස ගත්කල මුළු ජවන සිත් ගණන 55කි. එසේ වුවද මෙම සූත්‍රයට අදාලව චක්ඛු විඤ්ඤාණය පහළවීම කාමාවචර අවස්ථාවක් නිසා විග්‍රහය කාමාවචර ජවන් සිත් 29 ට සීමා වේ. ඒවා නම්, අකුසල් සිත් 12 (ලෝභ මූල 08, ද්වේෂ මූල 02, මෝහ මූල 02 ) , හසිතුප්පාද සිත 01, මහා කුසල් සිත් 08 , මහා ක්‍රියා සිත් 08 ය.

ඉහත සිත් විසිනවය මගින් “යං සඤ්ජානාති තං විතක්කෙති” යන තැන
සඤ්ඤාවෙන් **විද්‍යාමාන වූ ද අවිද්‍යමාන වූ ද** අරමුණ යම් සේ හඳුනා ගන්නා ලද්දේ ද එය විතර්ක වශයෙන් පරිකල්පනය කරයි.
***(සඤ්ඤාය හි යථාසඤ්ඤාතං විජ්ජමානං, අවිජ්ජමානං වා ආරම්මණං විතක්කවසෙන පරිකප්පෙති – මජ්ඣිමනිකාය ටීකා, මධුපිණ්ඩිකසුත්තවණ්ණනා)***

පරමාර්ථ වශයෙන් ඇත්තා වූ චිත්ත, ඵස්ස, වේදනා, සඤ්ඤා, චේතනා, පඨවි, ආපෝ යනාදිය සත්‍ය වූ භූත වූ විද්‍යමාන ධර්මතා වේ. පරමාර්ථ වශයෙන් නැත්තා වූ මේසය, පුටුව, වස්ත්‍රය, ස්ත්‍රිය, පුරුෂයා ආදි අවිද්‍යමාන ප්‍රඥප්ති වේ. ඒවා පරමාර්ථ වශයෙන් විද්‍යමාන නොවන බැවිනි.

<u>ඇතැම් සාවද්‍ය මත</u>

1. ” දිට්ඨයේ දිට්ඨ මත්තං…” දකින ලද දෙය දැකීම් මාත්‍රයක් පමණයි යනුවෙන් කියනුයේ වර්ණ මාත්‍රයක් දැකීමෙන් නැවතීමක් ගැනද…? නොවන්නේද..?
වර්ණ මාත්‍රයක් දැකීමක් යැයි නොකිය යුතු වන්නේ වෙයි..

2. වර්ණ මාත්‍රයෙන් එහාට මව පියා යැයි හඳුනාගැනීම මෝහය නිසා වන්නේද…?
එසේද නොකිය යුතු වන්නේ වෙයි..

3. යමෙක් මෝහය නිසා වනවා යැයි කියයි නම්…?
එසේ වීනම් රහතන් වහන්සේටද මෝහය තිබිය යුතු වන්නේ වෙයි..මන්ද යත් උන්වහන්සේලාද මව පියා වශයෙන් හඳුනාගන්න බැවිණි.එබැවින් එකී කියමන බැහර කළ යුතුය.

4. එසේ නම් කවරක් ” දිට්ඨයේ දිට්ඨ මත්තං ” වන්නේද…?
යමක් ඔබ විසින් දක්නා ලද්දේ නම් ඒ හරහා කෙළෙස් නූපදවාගෙන සිටීමයි..එනම් අනුසය වර්ධනය සඳහා කටයුතු නොකිරීමයි..

5. අරිහත් උතුමන්ට එදිනෙදා ජීවිතය තුළ දකින දෙය හුදු වර්ණ මාත්‍රයක් ලෙස අරමුණු වනේද..?
නොවන්නේ වෙයි..උන්වහන්සේලාද දක්නා දෙය මව පියා ආදී වශයෙන් හඳුනාගනී…බුදුරජාණන් වහන්සේට යමක් දැකීම තුළ ඥාන සම්ප්‍රයුක්ත මහා ක්‍රියා සිත් සතර, රහතන් වහන්සේලාට මහා ක්‍රියා සිත් අටද ලැබෙන්නේ වෙයි.

6. පෘතග්ජන සත්වයාට සහ රහතන් වහන්සේට කෙසේ දිට්ඨයේ දිට්ඨය මත්තං වනේද..?
අප විසින් යම් ප්‍රඥප්ති අරමුණක් දකින කළ ප්‍රපංචය ගොඩනගා නොගනීද කෙළෙස් අනුසය වර්ධනය නොකර ගනීද '' දිට්ඨයේ දිට්ඨය මත්තං'' වන්නේ වෙයි. රහතන් වහන්සේට වනාහී අනුසය කෙලෙස් ප්‍රහාණය වූ බැවින් අනුසය වර්ධනයක් හෝ සක්කාය දිට්ඨී වශයෙන් නොගන්නේ වෙයි. ප්‍රපංච ගොඩනැගීමක් නොවන්නේ වෙයි. එනයින් '' දිට්ඨයේ දිට්ඨය මත්තං'' වන්නේ වෙයි.

7. යමෙක් වර්ණ සටහනින් නවතා ගැනීමම ''දිට්ඨයේ දිට්ඨයමත්තං'' යනුවෙන් කීම කෙසේ අර්ථ විරහිත වේද...?
එසේ කියයි නම් යමෙකුට බුදුරජාණන්වහන්සේ හෝ හඳුනාගත නොහැක.. බුදුරජාණන්වහන්සේටද වර්ණ මාත්‍රය පමණක් අරමුණු වේනම් කිසිවක් කළ නොහැක්කේ වෙයි..'' විශාලාව රමණීයයි '' ආදි වශයෙන් හෝ ''මේ ගිජුකුළු පව්ව'' ආදී වශයෙන් හෝ කිසිවක් කිව නොහැක්කේ වෙයි.

8. දිට්ඨයේ දිට්ඨය මත්තං වර්ණ මාත්‍රය නම් '' සුතේ සුත මත්තං'' ආදිය කෙසේ කියන්නෙහිද...?
එසේ වීනම් එය සෝත ප්‍රසාදයේ ගැටුණු ශබ්ද රූප මාත්‍රයෙන් නැවතිය යුතුය. එසේ වූවහොත් කිසිවෙක්ට මාර්ගඵල නිර්වාන අධිගමය කරන්නට නොහැක්කේ වෙයි..මන්ද ඔවුන් කියන්නේ මොනවාදැයි හඳුනා නොගන්නා නිසාවෙනි..
එනයින් වර්ණ මාත්‍රයක්, ශබ්ද රූපයක් පමණක් යනාදී වශයෙන් එතැන්හී සියල්ල නවතින්නේ නම් බුදුරජාණන්වහන්සේට වන්නේ කිසිවෙකුට ධර්මය දේශනා නොකොටම පිරිනිවන්නටය.

<u>පරමාර්ථ වශයෙන් සත්ව ප්‍රඥප්තිය අරමුණු කරන ආකාරය</u>

අකුසල් සිත් 12 මගින් අරමුණු කිරීම.

1. ලෝභ සිත්වලින් අරමුණු කිරීම ආකාර 03කට සිදුවේ.
   i. <u>තණ්හාවෙන් අරමුණු කිරීම (දිට්ඨීගත විප්‍රයුක්ත ලෝභ සිත් 04)</u>

- තණ්හාවෙන් ආධ්‍යාත්මික වූ හෝ බාහිර වස්තුවක් කෙරෙහි ස්ත්‍රියය, පුරුෂයාය, ඉඩමය, රන්ය, රිදීය, යනාදී වශයෙන් ලෝභය උපදවා ගැනීම උදාහරණය. මෙහිදී පරමාර්ථ වශයෙන් අවිද්‍යමාන වන ස්ත්‍රියය, පුරුෂයාය යනාදී ප්‍රඥප්ති සිතට අරමුණු වේ.
- පෙර තමා කාම සම්පත්තියක් විඳි අවස්ථාවක තමාගේ සිතෙහි වූ ප්‍රීතිය තණ්හාවෙන් සිහිකිරීම ද උදාහරණයකි. මෙහිදී පරමාර්ථ වශයෙන් විද්‍යමාන වන ප්‍රීතිය සිතට අරමුණු වේ.

ii. <u>දෘෂ්ටියෙන් අරමුණු කිරීම (දිට්ඨිගත සම්ප්‍රයුක්ත ලෝභ සිත් 04)</u>
දෘෂ්ටිය මූලික වශයෙන් ශාස්වත සහ උච්ඡේද ලෙස දෙවැදෑරුම් වේ.

- ස්කන්ධ පඤ්චකය ඒකත්වයෙන් ගෙන සත්වයා යන සම්මුතියෙහි පිහිටි කල්හි එම සත්වයා හට මරණින් මතු ආත්මයක් ඇත හෝ නැත යැයි සළකා අවිද්‍යාමාන වූ සත්ව ප්‍රඥප්තිය කෙරෙහි දෘෂ්ටිය උපදී. මෙහිදී පරමාර්ථ වශයෙන් අවිද්‍යමාන වන සත්ව ප්‍රඥප්තිය සිතට අරමුණු වේ.
- රූප,වේදනා,සඤ්ඤා,සංස්කාර,විඤ්ඤාණ යන ස්කන්ධ පඤ්චකය කෙරෙහි ඇති වන විසි වැදෑරුම් සක්කාය දිට්ඨිය විද්‍යමාන වූ ස්කන්ධයන් කෙරෙහි පහළ වේ.

ඉහත ආකාර දෙක පිළිබඳ සංයුක්ත නිකායේ ඛන්ධවග්ගපාලියේ සමනුපස්සනා සූත්‍රයෙහි පැමිණේ.

***“යෙ හි කෙචි, භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා අනෙකවිහිතං අත්තානං සමනුපස්සමානා සමනුපස්සන්ති,සබ්බෙතෙ පඤ්චුපාදානක්ඛන්ධෙ සමනුපස්සන්ති, එතෙසං වා අඤ්ඤතරං. කතමෙ පඤ්ච? ඉධ, භික්ඛවෙ, අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො රූපං අත්තතො සමනුපස්සති, රූපවන්තං වා අත්තානං;අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං. වෙදනං… සඤ්ඤං… සඞ්ඛාරෙ… විඤ්ඤාණං අත්තතො සමනුපස්සති,විඤ්ඤාණවන්තං වා අත්තානං; අත්තනි වා විඤ්ඤාණං, විඤ්ඤාණස්මිං වා අත්තානං”***

මහණෙනි, යම් කිසි ශ්‍රමණ කෙනෙක් වෙත්වයි බ්‍රාහ්මණ කෙනෙක් වෙත්වයි දෘෂ්ටි වශයෙන් දක්නාහු අනේකප්‍රකාර ආත්මය දකිත්. ඒ සියල්ලෝ පඤ්චෝපාදාන ස්කන්ධයන් දෘෂ්ටිවශයෙන් දකිති. ඒ පඤ්චෝපාදානස්ඛන්ධ අතුරෙන් අන්‍යතරයක් හෝ දකිත්.කවර පසෙක් යත්:මහණෙනි, මෙලොව අශ්‍රැතවත් පෘථග්ජන තෙමේ ආර්‍ය්‍යයන් නො දක්නාසුලු වූයේ ආර්‍ය්‍යධර්‍මයෙහි අකොවිද (අදක්ෂ) වූයේ ආර්‍ය්‍යධර්‍මයෙහි අවිනීත වූයේ, සත්පුරුෂයන් නො දක්නාසුලු වූයේ සත්පුරුෂධර්‍මයෙහි අකොවිද වූයේ සත්පුරුෂධර්‍මයෙහි අවිනීත වූයේ රූපය ආත්මයයි (දෘෂ්ටිවශයෙන්) දකී. (සෙවණ ඇති රුකක් මෙන්) ආත්මය රූපවත් කොට හෝ, (මලෙහි සුවඳ මෙන්) ආත්මයෙහි රූපය හෝ, (කරඬුයෙහි මැණික මෙන්) රූපයෙහි ආත්මය හෝ දකී. වේදනාව ආත්මීය යි (දෘෂ්ටිදර්‍ශනයෙන්) දකී. ආත්මය වේදනාවත් කොට

හෝ, ආත්මයෙහි වේදනාව හෝ, වේදනායෙහි ආත්මය හෝ දකී. සංඥාව ආත්මයයි දකී. ආත්මය සංඥාවත් කොට හෝ, ආත්මයෙහි සංඥාව හෝ, සංඥයෙහි ආත්මය හෝ දකී. සංස්කාරයන් ආත්මය යි දකී. ආත්මය සංස්කාරවත් කොට හෝ, ආත්මයෙහි සංස්කාරයන් හෝ, සංස්කාරයන්හි ආත්මය හෝ දකී. විඥානය ආත්මය යි දකී. ආත්මය විඥනවත් කොට හෝ, ආත්මයෙහි විඥානය හෝ, විඥානයෙහි ආත්මය හෝ දකී." – ( සංයුත්තනිකාය- ඛන්ධවග්ගපාලි-සමනුපස්සනාසුත්‍රය)

*(පඤ්චුපාදානක්ඛන්ධෙ සමනුපස්සන්ති එතෙසං වා අඤ්ඤතරන්ති පරිපුණ්ණගාහවසෙන පඤ්චක්ඛන්ධෙ සමනුපස්සන්ති, අපරිපුණ්ණගාහවසෙන එතෙසං අඤ්ඤතරං. සංයුත්තනිකායට්ඨකථා- සමනුපස්සනාසුත්තවණ්ණනා; පරිපුණ්ණගාහවසෙනාති පඤ්චක්ඛන්ධෙ අසෙසෙත්වා එකජ්ඣං ''අත්තා''ති ගහණවසෙන. එතෙසං පඤ්චන්නං උපාදානක්ඛන්ධානං අඤ්ඤතරං ''අත්තා''ති සමනුපස්සන්ති – සංයුත්තනිකායටීකා- සමනුපස්සනාසුත්තවණ්ණනා)*

iii. මානයෙන් අරමුණු කිරීම. (දිට්ඨිගත විප්‍රයුක්ත ලෝභ සිත් 04)

- අන් පුද්ගලයන් සමඟ සන්සන්දනය කරමින් ඇති වන නවවිධ මානයන් උපදින අවස්ථාවලදී පරමාර්ථ වශයෙන් අවිද්‍යාමාන වන සත්ව ප්‍රඥප්තිය සිතට අරමුණු වේ.
- යමෙක් ධ්‍යානයකට සමවැදී ඉන් නැගිට තමාගේ ධ්‍යානය පිළිබඳව මානය උපදවා ගනී. එවිට සිතට අරමුණු වනුයේ විද්‍යාමාන ධර්මතාවක් වන ඒකාග්‍රතා චෛතසිකයයි.

2. ද්වේශයෙන් අරමුණු කිරීම. (ද්වේෂ මූල සිත් 02)

- සත්වයෙකු අරමුණ කොට ද්වේශය උපදවා ගැනීම. මෙහිදී පරමාර්ථ වශයෙන් අවිද්‍යාමාන වන සත්ව ප්‍රඥප්තිය සිතට අරමුණු වේ.
- කෝපයට පත්වූ අවස්ථාවක් සිහිකරමින් පසුතැවෙන අවස්ථාවක පෙර තම සන්තානයෙහි පහළ වූ ද්වේෂය අරමුණ කරගෙන සිත් උපදී. එවිට සිතට අරමුණු වනුයේ විද්‍යාමාන ධර්මතාවක් වන ද්වේෂ චෛතසිකයයි.

3. මෝහයෙන්ද මේ ආකාරයට අරමුණ කරගත හැක.

4. කුසල් සිත් 08 මගින්

- සත්වයන් අරමුණු කරගෙන මෛත්‍රිය වැඩීමේදී එම සත්ව ප්‍රඥප්තිය මෛත්‍රීයට අරමුණු වේ. එය අවිද්‍යාමාන වූවක් කෙරෙහිය.
- විදර්ශනා කර විදර්ශනා කරන ලද සිත නැවත විදර්ශනාවට ලක් කිරීම. මෙහි දෙවන වර විදර්ශනාවට අරමුණු වන සිතට අරමුණු වන පළමු විදර්ශනා සිත පර්මාර්ථ වශයෙන් විද්‍යාමාන වන ධර්මයකි.

5. මහා ක්‍රියා සිත්වලින් අරමුණු කිරීම.

- රහතන් වහන්සේ සම්මුතිය අරමුණු කරන අවස්ථාවේ දී අවිද්‍යමාන වූ සත්වයන් අරමුණු වේ.
- රහතන් වහන්සේ විදර්ශනා කරන විටදී උන්වහසේ හට විදර්ශනා සිතට අරමුණු වනුයේ විද්‍යාමාන වූ පරමාර්ථ ධර්මයෝය.

6. හසිතුප්පාද සිත

- රහතන් වහන්සේ ලෝකීය වූ පුද්ගලයන් අරමුණු කරගෙන සිනහ පහළ කරන අවස්ථාවේදී හසිතුප්පාද සිතට අරමුණුවනුයේ අවිද්‍යමාන වූවකි.
- බාහිර පුද්ගලයන්ගේ සිත දැන එයට සිනහ පහළ කිරීම් වශයෙන් විද්‍යමාන ධර්මතාවක් වන සිත අරමුණු වේ.

ඉහත දක්වා ඇති අවස්ථා අතරෙන් ප්‍රපඤ්ච සහගත වනුයේ තණ්හා දිට්ඨි වශයෙන් සිත් පහළ වන අවස්ථාවන්ය.

**මීළඟ ලිපියෙන් අපි මෙකී ප්‍රපංචයන් ක්‍රියාත්මක වන කාලය, මනෝද්වාරාවර්ජන චිත්ත වීථිය තුළ ප්‍රපඤ්චයන් ක්‍රියාත්මක වන අයුරු සහ ඉතිරි සූත්‍රපාඨ විස්තරද දක්වන්නෙමු.**